වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව

வருடாந்த செயலாற்றுகை மற்றும் நிதியறிக்கைகள்

2021

Annual Performances & Financial Reports

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිලිනොච්චි

மாவட்ட செயலகம் கிளிநொச்சி

District Secretariat Kilinochchi

01 ආයතනයේ විස්තර

පටුන

1.1.	කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැඳින්වීම	01
1.1.1.	පරිපාලන සීමාවන්	01
1.1.2.	ඉතිහාසයේ විශේෂ සටහන්	01
1.1.3.	ස්වභාවික සම්පත්	02
1.1.4.	වාණිජ හා ආර්ථික කටයුතු ක්‍රියාකාරකම්	02
1.2.	වාණිජ හා ආර්ථික කටයුතු ක්‍රියාකාරකම්	03
1.2.1.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු	04
1.3.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්	05
1.4.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටීමේ සිතියම	06
1.5.	දේශීය කාර්යාල හා ග්‍රාම නිළධාරි වසම්වල විස්තර	07
1.5.1.	ජන සංඛ්‍යාලේඛණ පිළිබඳ විස්තර	07
1.5.2.	මූලික තොරතුරු	07

02 විශේෂ ජයග්‍රහන අභියෝගහාඉදිරිඉලක්ක 08-35

2.1	විශේෂජයග්‍රහන හාඅභියෝග	36-37

03 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය *සාධනය*

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	38
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	39
3.3	මුදල් ප්‍රවාහ පිළබඳ ප්‍රකාශය	40
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	41-73
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	74

3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	**75**
3.7	මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව වැය කිරීම සඳහා වන ප්‍රතිපාදන	**76-82**
3.8	මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	**83**
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	**84-100**
04	**කාර්ය සාධන දර්ශක**	**101**
4.1.	ආයතනයේ කාර්ය සාධන දර්ශක	**101**
05	**තිරසාර සංවර්ධන ඉලක්ක**	102
5.1	හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන ඉලක්ක	**102**
5.2.	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	**105**
06	**මානව සම්පත් පැතිකඩ**	**106**
6.1.	සේවක සංඛ්‍යා කළමනාකරණය	**106**
6.2.	හිඟ මානව සම්පත්	**106**
6.3.	මානව සම්පත් සංවර්ධනය	**107-109**
07	**අනුකූලතා වාර්තාව**	**110-117**

1.ආයතනයේ තොරතුරු

1.1 කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම.

1.1.1 පරිපාලන මායිම්

උතුරුපළාතේ මධ්‍යම ප්‍රදේශයේ පිහිටා ඇති කිළිනොච්චි දිස්ත්‍රික්කය උතුර යාපනය දිස්ත්‍රික්කය සීමාව ලෙසද නැඟෙනහිර හා දකුණු දිසාව මුලතිව් දිස්ත්‍රික්කය සීමාව ලෙසද බස්නාහිර දිසාව හා දකුණු දිසාව මන්නාරම් දිස්ත්‍රික්කයද මායිම් වශයෙන් ද පිහිටා ඇත.



1.1.2 ඓතිහාසික වැදගත්කම්

ශ්‍රී ලංකාවේ පළමුවන මානව ජනාවාසයේ ආරම්භන සළකුණ ලෙස ඉරණමඩු ප්‍රදේශය හඳුනා ගැනීම මඟින් කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පෞරාණිකත්වය පටන් ගනු ලැබෙයි. යාපනය දිස්ත්‍රික්කය සමඟඒකාබද්ධව දක්නට තිබූ කිලිනොච්චි ප්‍රදේශය නව දිස්ත්‍රික්කයක් ලෙස 1984 වර්ෂයේ පිහිටුවන ලදී. ඒම කාල වකවානුවේ කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වාසය කළ ජනතාවන් කෘෂිකර්මය, දඩයම් කිරීම, ධීවර කටයුතු සහ සත්ව පාලනයද සිදු කර ගෙන ගිය අතර ඒය ගබඩා කර තැබීමේපළ පුරුද්දද ඇති අයවලුන්වූහ.

මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉරණමඩු වැව ඇතුළු මහා වාරිමාර්ග වැව් 04 ක්ද මධ්‍යම වාරිමාර්ග ගණයට අයත් වැව් 05 ක්ද කුඩා වාරිමාර්ග වැව් 394 ක්ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම මඟින් ජනතාවන්ගේ ජීවනෝපාය ක්‍රමයන් පිළිබිඹු කරයි. තවද තාක්ෂණය හා කලාත්මකභාවයෙන් යුතු ජන සමූහයක් මෙම ප්‍රදේශයේ විසූ බව විශ්වාස කරනු ලැබේ.

මෙම දිස්ත්‍රික්කයේ ඓතාහාසික වැදගත්කමකින් යුතු උරුත්තිරපුරම් සිවන් කෝවිල, පුකියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙ ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය, පාලෙත්තීවු ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය හා පොන්නාවෙලි සිවන් කෝවිල ආදිය සමඟ පූනකරි ඕලන්ද බලකොටුව ආදියද දක්නට තිබේ.

1.1.3 ස්වාභාවික සම්පත්

ස්වාභාවික සම්පත් ලෙස ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම කුරුළු අභය භූමිය, වන්නේරික්කුලම් කුරුළු අභය භූමියහා ගෞදාරිමුනෙ මුහුදු වෙරළද දැකිය හැකියි.

1.1.4 වාණිජ හා ආර්ථික කටයුතු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවන්ගෙන් බහුතරයක්ම වී ගොවිතැන සමඟ ධාන්‍ය වගා කිරීමේ කටයුතුවල හා සත්ව පාලනය, පළතුරු වගාව සහ ධීවර රැකියාවෙහිද නිරතව සිටිති.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම මෙහෙවර ක්‍රියාකාරකම්වල අගයන්

දැක්ම

නවීකරණය කරන ලද දිස්ත්‍රික් පරිපාලනය මඟින් ඵලදායිතාවයෙන් යුතු මහජන සේවයක් ලබාදීම

මෙහෙවර

රජයේ ප්‍රතිපත්ති අනුව කාර්යක්ෂමතාවය උපයෝගී කර ගනිමින් විශිෂ්ඨ සම්බන්ධීකරණයක් මඟින් දිස්ත්‍රික්කයේ සංවර්ධන හා සමාජ සංස්කෘතික සාරධර්ම ඉහළ නැංවීම

අරමුණු

1. අපක්ෂපාති අවංක ඵළදායිතාවයෙන් යුතු ඉක්මන් මහජන සේවාවක් ලබාදීම
2. සියළු සේවකයන් සමව ගරු කිරීම හා සේවකයින්ගේ සුභසාධන කටයුතුවලට ප්‍රමුඛත්වයක් ලබාදීම
3. පරිසරයට හිතකර ප්‍රවේශ උපයෝගි කිරීම
4. ආබාධිත හා වැඩිහිටි අයවලුන්හට නිහතමානී සේවාවක් ලබාදීම
5. කාර්යාලයේ අනුගමනය කළ යුතු න්‍යායන් හා සිරිත් විරිත් සියළුම සේවකයන් පිළිගැනීම හා අනුගමනය කිරීම
6. නවීන විද්‍යුත් ක්‍රම මඟින් ජනතාවට පහසු සේවාවක් ලබාදීම.

1.2.1 දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ අරමුණු;

- දත්ත විද්‍යුත්කරණය කිරීම හරහා පහසු මහජන සේවයක් ක්‍රියාත්මක කිරීම
- කාර්යක්ෂමතාවයෙන් යුතු සම්පත් උපයෝගිතාවය
- සේවා ලාභීන් හා සම්පත්වල ඵලදායිතාවය ඉහළ මට්ටමකට ගෙන යාම
- පාරිසරික හිතකාමී නිෂ්පාදන භාණ්ඩ උපයෝගිතාවය
- ජනතාවන්ට පහසු සේවාවක් ලබාදිය හැකි අයුරෙන් කාර්යාලය වෙනස් කර පිහිටුවීම.
- දිස්ත්‍රික්කයේ ජනතාවන්ගේ ජීවන තත්වය ජාතික ජීවන තත්ව මට්ටමට ඉහළ නැංවීම
- සමෘද්ධි යටිතල පහසුකම් වර්ධනය, රැකියා අවස්ථාවන් වැනි ක්‍රියාකාරීන් මගින් දිළිඳුකම හැකි තරම් අවම කිරීම
- ජීවනෝපායාධාර මඟින් තිරසාර ආදායම් මට්ටම තහවුරු කිරීම
- ආයතනය සඳහා වන විකල්ප කළමනාකරණයක් ගොඩනැඟීම
- ආයතනයේ තිරසාර ප්‍රවර්ධනය ලඟා කර ගැනීම
- තිරසාර සංවර්ධන මට්ටම අඛණ්ඩව තහවුරු කර ගැනීම

1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කටයුතු

කාර්යක්ෂමතාවයෙන් යුතු දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය

- දිස්ත්‍රික්ලේකම්කාර්යාලයේහාප්‍රාදේශීයලේකම්කාර්යාලඅතරපරිගණකජාලසම්බන්ධකිරීමඅභ්‍යන්තරපරිගණකජාලක්‍රමයන්හාබාහිරජාලයන්ද පිහිටුවීම

- නිළධාරීන්සම්බන්ධවවනපුද්ගලිකලිපි ගොනුපවත්වාගෙනයාම,වැටුප් හා වෙනත් දීමනා,දුම්රිය ගමන් බලපත්‍ර ලබා දීම හා නිළධාරීන්ගේ නිළයන්ට අවශ්‍ය වන අයුරෙන් පුහුණු ලබාදීම

- විශ්‍රාමිකනිළධාරීන්සඳහාවිශ්‍රාමවැටුප්ගෙවීමටඇවැසිකටයුතුසිදුකිරීම.

පිවිතුරු පොදු සේවාවන් ග්‍රාම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ජනතාවන්ට ලබා දීම හා ලබා ගැනීම තහවුරු කර ගැනීම

- ජාතික හැඳුණුම් පත්, මෝටර් රථ වාහන බදු, ව්‍යාපාර ලියාපදිංචිය ආදිය ලබාදීම.
- උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි ප්‍රමාදයෙන් තොරව සිදුකිරීම හා ඒවායේ පිටපත් ලබාදීම
- රියදුරු බළපත්‍ර ලබාදීම
- ඉඩම් බළපත්‍ර ලබාදීම සඳහා කටයුතු සළසාදීම හා ඉඩම් ගැටළු විසඳීම
- සංස්කෘතිකසිරිත්විරිත්භාශාරීරිකභාමානසිකයහපැවත්ම
- කලා හා සංස්කෘතික උත්සව පැවත්වීම හා කලාව හා සංස්කෘතිය හා සබැදි තරඟ පැවත්වීම
- දිස්ත්‍රික් ක්‍රීඩා උත්සව හා ආබාධිත අයවලුන් සඳහා වන ක්‍රීඩා උත්සව පැවත්වීම
- යහපත් පුරවැසියන් බිහිකිරීමට හැකිවනසේ ළමුන්ට හා තරුණයින්හට දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම සහ උපදේශන ප්‍රවර්ධන වැඩ සටහන් පැවත්වීම.

ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සිටින ජනතාවන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය හා කෘෂිකර්ම කටයුතු ආදියට උපකාර කරන අතර දිළිඳු මට්ටම තුළ සිටින අයවලුන්ට සහනාධාර හා ජීවනාධාර උපකාර ලබාදීම.

- කාන්තාමූලිකත්වයදරණපවුල්වලටස්වයංරැකියාපුහුණුලබාදීමහාදිරිදීමනාලබාදීම
- වැඩිහිටියන්ට හා ආබාධිත අයවලුන්හට සහ විශේෂිත රෝගී තත්වයේ පසුවන අයවලුන්හට දීමනා ලබාදීම
- ආපදා කළමනාකරණ සේවා ඒකකය විසින් ග්‍රාමීය මට්ටමේ හදිසි ආපදා හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම හා ඒම අවස්ථාවේම ආපදා සහන සේවාවන් ක්‍රියාත්මක කිරීම
- ඡන්ද නාම ලැයිස්තු ලියාපදිංචි කටයුතු සිදු කිරීම හා මැතිවරණ සම්බන්ධීකරණය
- ගොවියන්ට අවශ්‍ය බීජ,යෙදුම් ද්‍රව්‍ය හා කෘෂි උපකරණ ලබා දීම
- මාර්ග සංවර්ධන,වාරිමාර්ග,විදුලි පහසුකම් සළසා දීම හා නිවාස යෝජනා ව්‍යාපෘති කටයුතු සැකසීම හා යුද්ධයෙන් පීඩාවට පත්වූ අයවලුන්හට වන්දි මුදල් ලබාදීම හා දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන කටයුතු සංවිධානය කර නියාමනය කිරීම්

1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිතියම



1.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශහා ග්‍රාම නිළධාරි වසම්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	ග්‍රාම නිළධාරි වසම්
කරච්චි	42
කන්ඩාවලෙ	16
පූනකරි	19
පච්චිලෙප්පල්ලි	18

1.5.1 ජනගහණතොරතුරු

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	පවුල් සංඛ්‍යාව	සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව	පිරිමි	ගැහැණු	දෙමළ	සිංහල	මුස්ලිම්
1	කරච්චි	26389	78376	37848	40528	77422	93	861
2	කන්ඩාවලෙ	9042	26994	13095	13899	26967	2	25
3	පූනකරි	8228	27288	13646	13642	25568	8	1712
4	පච්චිලෙප්පල්ලි	4727	14684	7202	7482	14632	25	27
		48326	**147342**	**71791**	**75551**	**144589**	**128**	**2625**

1.5.2 මූලික තොරතුරු

දිස්ත්‍රික්කය	කිලිනොච්චිය
පළාත	උතුර
මුළු භූමි ප්‍රමාණය	1279 sqkm
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව	04
ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව	95
ගම්මාන සංඛ්‍යාව	354
ජන්ද කොට්ඨාශ සංඛ්‍යාව	107
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව	03
කළාප අධ්‍යාපන කාර්යාල	02
පාසල් සංඛ්‍යාව	104
අධ්‍යාපනය හැදෑරන සිසුන් සංඛ්‍යාව	31941
ගුරුවරුන් සංඛ්‍යාව	2056
ජනගහණය	147342

02. වැඩි දියුණු කිරීම හා ඉදිරි දැක්ම

➢ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු

උතුරු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන කිලිනොච්චි දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ලෙස පහත දක්වා ඇති දෑ සඳහන් කළ හැකියි.

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරක ග්‍රාම සංවර්ධන සමිති 173 ක්ද කාන්තා ග්‍රාම සංවර්ධන සමිති 99 ක්ද ලියාපදිංචි කර ක්‍රියාත්මක වෙමින් පවතියි. මෙම සියළුම සමිතීන් ග්‍රාමීය මට්ටමේ විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක වන සමාජ මට්ටමේ සංවිධාන වේ.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ රැකියා විරහිතව සිටින ග්‍රාමීය තරුණියන් ස්වයං රැකියාවන්හි දිරි ගැන්වීම සඳහා හා පැසැල් අධ්‍යාපනය අතර මඟදී හැර ගොස් රැකියා අවස්ථාවන් සොයා ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට උපකාර වන අරමුණෙන් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවා කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ උපදේශක හරහා ග්‍රාමයන්හි කාන්තාවන් හා සබැඳි නොයෙක් වර්ගයේ ඇඳුම් නිර්මාණය, අත්කම්, ගෘහ ආර්ථිකය, සෞන්දර්ය පුහුණු ලබා දෙනු ලැබේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි, කණ්ඩාවලෙ, පූනකරි, පච්චිලෙප්පල්ලි ආදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක වන කාන්තා සංවර්ධන මධ්‍යස්ථානවල සිසුන් 20 දෙනෙක් බැගින් සිසුන් 80 දෙනෙක් පුහුණුව ලබා පිටත් වී ඇත. මෙම අයවලුන්හට මාස 12 න් යුතු ගෘහ ආර්ථික ඩිප්ලෝමා පාඨමාලාව යන මැයෙන් පුහුණුව ලබා දෙනු ලැබුවේය. සෑම සිසුවෙකුටම දිනකට දිරි දීමනාව ලෙස රුපියල් 200 ක මුදලක් ලබාදෙනු ලැබුවේය. පුහුණුව අවසානයේ සියළුම ප්‍රාදේශිය කොට්ඨාශවල විභාග පවත්වා,අවසානයේ ප්‍රාදේශීය හා පළාත් මට්ටමෙන් ප්‍රදර්ශනයක්ද පවත්වනු ලැබුවේය.

උතුරු පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේවෙබ් අඩවි ක්‍රම මඟින් අවශ්‍ය කරුණු ලබා ගැනීමේ පහසුකම් සකසා ක්‍රියාත්මක කර ඇත.

* ප්‍රාදේශීය වශයෙන් යාවත්කාලීන කිරීමේ තොරතුරු
* ලියාපදිංචි සමිති
* ලියාපදිංචි සමිතිවල පරිපාලන විස්තර
* ලියාපදිංචි සමිතිවල දේපළ විස්තර.
* සමිතිවල හා සමිති සාමාජිකයින්ගේ ස්තරම් නිෂ්පාදන පිළිබඳ තොරතුරු විස්තර
* දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති ග්‍රාමීය කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවල අංකය සමඟ විස්තර ලියාපදිංචි අංකය.
* යාවත්කාලීන කළ හැකි පහසුකම්.
* ව්‍යවස්ථා රීති
* පුහුණු අයැදුම්.
* ලියාපදිංචි සහතිකය.
* දෙපාර්තමේන්තු චක්‍රලේඛ.

ප්‍රාමණිය පදනම මත වූ ප්‍රාග්ධන පරිත්‍යාග වැඩසටහන්ද සිදු කර ගෙන යනු ලබන්නේය.

වැඩ සටහන්	ප්‍රතිපාදන	වියදම
නව ගොඩනැඟිලි ඉදිකිරීම	2000000	1985275
පාලම් තැනීම	700000	678436
ඇඹරුම් හල්	500000	493874
එකතුව	3200000	3157586

➢ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුව වනාහි කාන්තා,ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරීන් පත් කර ඇත. මෙම පත්වීම මඟින් සියළුම ලමුන්හට සම අවස්ථාවන් ලබාදීම විශේෂයෙන් අනාථ,අසරණ හා නීතිය හා සමඟ විෂමතා ඇති කර ගත් ලමුන් සඳහා වන ආරක්ෂණ හා නඩත්තු කිරීම ලබාදීමයි. ඒ අනුව 2021 වර්ෂයේ සිදුකරන ලද වැඩසටහන් පහත දැක්වේ.

අංක	වැඩසටහන	වැඩ සටහන් විස්තර	වැය වන මුදල
1	අධ්‍යාපන අධාර ලමුන් 24 දෙනෙක්	ආර්ථික අපහසුතාවයන්ට ලක්වී පාසැල් අධ්‍යාපනය මඟහැර නතර කළ සිසුන් හා අක්‍රමවත් පැමිණීමක් ඇති සිසුන් සඳහා පාසැල් උපකරණ ලබාදී නැවත සම්බන්ධ කිරීම	24000
2	සෞඛ්‍යආධාරලමුන් 15 දෙනෙක්	රෝගයෙන් පීඩා විඳ ආර්ථික තත්වයෙන් පසු බෑමට ලක්වී ඇති ලමුන්හට ප්‍රතිකාර සඳහා ආධාර	75000
3	නිවුන්දරුවන්සඳහාවනආධාර මුදල ලමුන් 12 ක්	නිවුන්දරු උපත් සිදුකර ආර්ථික තත්වයෙන් පසු බෑමට ලක්වී ඇතිපවුල් සඳහා වන ආධාර	45000
4	දිස්ත්‍රික්හාප්‍රාදේශීයලමාසංවර්ධනකමිටුසාකච්ඡාවන් 15 ක්	ලමා සහභාගිත්වය හරහා වූ ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම	12500
5	ආබාධිත ලමුන් සඳහා වන ආධාර	දිස්ත්‍රික් ලමා සමාජයේ සිටින ආබාධිත ලමුන්ගේ විශිෂ්ඨ සහභාගිත්වය දිරි ගැන්වීම සඳහා ආභාධිත ලමුන් 2 ක් සඳහා වන දීමනාව	5000
6	ජගත් ලමාදිනඋත්සව	ජගත් ලමා දින උත්සවය නිමිත්තෙන් දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීම	15000

7	ළමාසමාජස්වේච්ඡාසාමාජිකයින්සඳහා වන පුහුණු පාඨමාලා	ලමා සමාජ කටයුතු ඉදිරියට ගෙන යමින් මඟ පෙන්වන්නන් ලෙස ක්‍රියා කැන ස්වේච්ඡා සේවකයන් සඳහා වන හැකියා වර්ධන පුහුණුව පුහුණුව ලබාදීමේ වැඩ සටහන	20000
8	ලමා මධ්‍යස්ථාන අධ්‍යයනය	ලමා හිතකාමී පරිසරයක් ඇති කිරීම සඳහා වන ලමුන් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	24500
9	සහරා නිර්මාණය කිරීම ලමුන් 414 ක් සහභාලිවිය.	ලමා සමාජයේ ලමුන්ගේ නිර්මාණ ඇතුළත් සහරා සකස් කිරීම	25000
10	අන්තර්ජාල පරිහරණ කිරීමේ ආරක්ෂාව වැඩ සටහන් 4 ක්	වෙබ්අඩවික්‍රමාණුකූලවභාවිතා කිරීම මඟින් ලමුන් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘති	20000
11	සමාජනඩත්තුවැඩසටහන	ආර්ථික තත්වයෙන් පසු බෑමට ලක්වී ඇතිපවුල්වල ලමුන්හට අඛණ්ඩව අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාමට මූල්‍ය ආධාර හා ඉගෙනුම් මෙවලම් ලබාදීම	252000
12	මාසික සාකච්ඡාවන් 6 ක්	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන්ගේ මාසික වැඩ සටහන් ප්‍රගති සමාලෝචන සාකච්ඡාව	7500
13	ලමා සංවර්ධන කමිටු සාකච්ඡාවන්	ප්‍රදේශයේ ලමා සමාජ කමිටු සාකච්ඡාවන්	8000
14	ලමා සංවර්ධන කමිටු සාකච්ඡාවන්	දිස්ත්‍රික් ලමා සමාජ කමිටු සාකච්ඡාවන්	3500
	එකතුව		**536100**

➢ ජාතික ලමාරක්ෂක අධිකාරිය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලමාරක්ෂණය සම්බන්ධයෙන් 2021 වර්ෂයේ සිදු කරන ලද වැඩ සටහන් :

1. ධීවර ගම්මානවල ලමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩ සටහන

   කන්ඩාවලෙ 01 27850

2. දුර්වල සිසුන් සඳහා ඉගෙනුම් මෙවලම් ලබාදීම

   කරච්චි 01 30000

3. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලමාරක්ෂණ නිළධාරීන් සඳහා වන සාකච්ඡාව

   කරච්චි පූනකරි පලෙ 11 7000

4 පාසැල් සිසුන් සඳහා වන මාධ්‍ය සමාජ ජාතික වැඩ සටහන

	කරච්චි, කන්ඩාවලෙ	01	20000
5.	විදේශ ගතව සිටින සේවකයන්ගේ ලමුනගේ ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩ සටහන		
	කරච්චි	01	20000

➢ මුල්ළමාවියසංවර්ධනඅංශයේකටයුතු

මුල්ළමාවියයන්නගර්භයේප්‍රසවවූදරුවාගේකාළයේසිටඅවුරුදු **5** දක්වා වූ කාලය වේ.

මුල්ළමාවියසංවර්ධනයයන්නළමුන්ගේභෞතිකතත්වය,මානසික වර්ධන තත්වය,සමාජ ප්‍රවර්ධනය හා දැනුම වර්ධනය වීම ආදිය ඒකරාශී කරන ලද පූර්ණ ක්‍රියා පටිපාටිය තහවුරු කිරීමවේ.

මෙහිඅරමුණ ළමුන්ගේ ශාරීරික මානසික වර්ධන හා පැහැදිලි මානසිකත්වයෙන් යහපත් සිරිත් විරිත් වලින් පාසල් යා හැකි තත්වයට ඔවුන්ව සූදානම් කිරීම වේ. කාන්තාහාළමාකටයුතුඅමාත්‍යාංශයේලමා කටයුතු කාර්යාලය විසින් දිවයින පුරා සිටින ලමුන් සැළකිල්ලට ගෙන පහත වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රධාන වැඩ කටයුතු

- පෙර පාසල් ලමුන්ට පෝෂ්‍යදායි උදේ ආහාරය ලබාදීම.
- ගැබිණි මව්වරුන් සඳහා රු. 20000 ක් වටිනා පෝෂ්‍යදායි ආහාර මලුවක් (මාස 10 ට) ලබාදීම.
- පිරිමි හා ගැහැණු ලමුන්ට එරෙහි අපයෝජන හා හිංසනවලින් පෙර ආරක්ෂාව සැපයීම.
- වැටුප් නොලබන පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසිකව රුපියල් 2500/- ක උපකාර මුදලක් ලබාදීම.
- ජාතික ලමා දිනය හා ලමුන්හට සෙනෙහස පරිසරයක් උපදවන වැඩ සටහන්
- ක්‍රියාත්මක කරනු ලබන මුල් ලමාවිය ආරක්ෂාව හා සංවර්ධන වැඩ සටහන්
- පෙර පාසල් විශේෂත්වයෙන් යුතුව ඉදිකිරීම (ලෝක බැංකුවේ 5 වසරකසැළසුම)

අංක	ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන	භෞතික ප්‍රගතිය	ප්‍රතිපාදන	වැය	xcmx

01	ගැබිණි මව්වරුන් සඳහා රු. 20,000/- ක් වටිනා පෝෂ්‍යදායී ආහාර මලුවක් ලබාදීම.	100	43050000	42828400	221600
02	පෙර පාසල් ලමුන්ට පෝෂ්‍යදායී උදේ ආහාරය ලබාදීම.	100	13498380	7001770	6496610
03	පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසිකව රුපියල් 2500/- ක උපකාර මුදලක් ලබාදීම.	100	652500	647500	5000
04	ගැබිණි මව්වරුන් ට මාතෘ පැකේජයක් ලබාදීම	100	80000	80000	00
	එකතුව		**57280880**	**50557670**	**6723210**







➢ කුඩා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය

තරුණ තරුණියන්ගේ වාණිජ හැකියාවන් හා ප්‍රයෝජනවත් බව වර්ධනය කිරීම මඟින් රැකියා උත්පාදනය වැඩි කර ආදායම් මට්ටම ඉහළ නංවා රටේ ආර්ථික කේෂේත්‍රයේ ව්‍යවසායකයින්ගේ උච්චතම අවස්ථාව ලබා ගැනීමේ අරමුණෙන් කුඩා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය නොයෙක් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් සිටියි. ඒ අනුව ව්‍යාපාරික අවස්ථාවන් හඳුනා ගැනීම ව්‍යාපාරික ගැටළු විසඳා ගැනීම, වෙළඳපොළ අවස්ථාවන් හඳුනා ගැනීම, තාක්ෂණික පුහුණු ලබාදීම හා ව්‍යාපාර වර්ධනය කිරීම පිළිබඳව ව්‍යවසායකයින්ගේ යහපත හා සබැඳි නොයෙක් වැඩ සටහන් කුඩා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබේ.

පාඨමාලා පිළිබඳ විස්තර – 2021

අංක	පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම
1.	ව්‍යාපාර සම්බන්ධව දැනුවත් කිරීම් හා මානසික සංවර්ධනය	කරච්චි	31	1950

2.	ව්‍යාපාර සම්බන්ධව දැනුවත් කිරීම් හා මානසික සංවර්ධනය	කන්ඩාවලෙ	25	1950
3.	ව්‍යාපාර සම්බන්ධව දැනුවත් කිරීම් හා මානසික සංවර්ධනය	පලෙ	25	1950
4.	ව්‍යාපාර සම්බන්ධව දැනුවත් කිරීම් හා මානසික සංවර්ධනය	පූනකරි	30	1950
5.	ගිණුම් සටහන් කිරීම	කන්ඩාවලෙ	20	5200
6.	වැය ඇගයීම් කළමනාකරණය	කන්ඩාවලෙ	20	5200
7.	වාණිජ ව්‍යාපෘතීන් හඳුනා ගැනීම	කරච්චි	25	3200
8.	වාණිජ ව්‍යාපෘතීන් හඳුනා ගැනීම	පූනකරි	26	8350
9.	ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන	කරච්චි	68	5400
10	ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන	පලෙ	66	7900
11	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විකුණුම් ප්‍රදර්ශනය	කරච්චි	60	40300
12	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විකුණුම් ප්‍රදර්ශනය	කන්ඩාවලෙ	25	32600
13	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විකුණුම් ප්‍රදර්ශනය	පලෙ	20	31400
14	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විකුණුම් ප්‍රදර්ශනය	පූනකරි	20	30700
15	සමෘද්ධි බල ගැන්වීමේ වැඩ සටහන	කරච්චි	105	12000
16	සමෘද්ධි බල ගැන්වීමේ වැඩ සටහන	කන්ඩාවලෙ	12	2540
17	සමෘද්ධි බල ගැන්වීමේ වැඩ සටහන	පූනකරි	16	2570
18	සමෘද්ධි බල ගැන්වීමේ වැඩ සටහන	පලෙ	49	5630
19	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන ව්‍යවසාය ප්‍රවර්ධන වැඩ සටහන	පූනකරි	16	3030
20	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන ව්‍යවසාය ප්‍රවර්ධන වැඩ සටහන	පලෙ	49	6340
21	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන ව්‍යවසාය ප්‍රවර්ධන වැඩ සටහන	කරච්චි	35	4700
22	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන ව්‍යවසාය ප්‍රවර්ධන වැඩ සටහන	කරච්චි	35	4700
23	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන ව්‍යවසාය ප්‍රවර්ධන වැඩ සටහන	කරච්චි	15	3084
24	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වනව්‍යාපාර සැලස්ම සකස් කිරීම	පූනකරි	16	6060
25	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වනව්‍යාපාර	පලෙ	49	13660

	සැලස්ම සකස් කිරීම			
26	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වනව්‍යාපාර සැලස්ම සකස් කිරීම	කරච්චි	35	14400
27	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වනව්‍යාපාර සැලස්ම සකස් කිරීම	කරච්චි	35	14400
28	සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වනව්‍යාපාර සැලස්ම සකස් කිරීම	කන්ඩාවලෙ	15	5284
29	තාක්ෂණික පුහුණු පාඨමාලාව	පූනකරි	20	6190
30	තාක්ෂණික පුහුණු පාඨමාලාව	පලෙ	20	7660
31	තාක්ෂණික පුහුණු පාඨමාලාව	කරච්චි	20	6260
32	තාක්ෂණික පුහුණු පාඨමාලාව	කන්ඩාවලෙ	20	8290
33	අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන.	පලෙ	10	6200
34	අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන	කන්ඩාවලෙ	10	7200







➢ අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර පාලන හා ක්‍රමවේදයන්ද ඒ හා සම්බන්ධ කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණවේ.

අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම වසරේ ප්‍රවර්ධන වසර සඳහා වන වැඩ සටහන් අනුව මාසික පෙර වැඩ සටහන් පදනම් කරමින් විගණනය කරන ලදී. **2021** වර්ෂයේ සම්පූර්ණයෙන් විගනන විමසුම් දාඅටක් යවන ලදී. යවන ලද විගණන විමසුම්වලට පිළිතුරු ලැබුණු අතර සුදුසු කටයුතු සිදු කර ඇති බව සඳහන් කළ යුතුයි. තවද පසු ගිය වසර සමඟ සැසඳීමේදී මෙම වසර ඉතාමත් කාර්යක්ෂමතාවයෙන් යුතුව තිබේ.

විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තර මෙසේ,

කරුණු	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය				එකතුව
		කරච්චි	කන්ඩාවලෙ	පච්චිලෙප්පල්ලි	පූනකරි	
නිරීක්ෂණ	04	04	04	03	03	18
පිළිතුරු	04	04	04	03	03	18
නොලැබුණු පිළිතුරු	-	-	-	-	-	-

තවද **නිරීක්ෂණ** පිටපත් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයටත් කළමනාකරණ විගණන අංශයටත් ජාතික විගණන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරිවරයාටත් යවා ඇත.

අභ්‍යන්තර විගණනයේ පැන නැඟුණු ගැටළු විසඳීම සඳහා වසරකට විගනන කලමනාකරණ විගණන රැස්වීම් තුනක් පවත්වන ලදී.ප්‍රථම රැස්වීම **2020** වසරේ **4** වන කාර්තුව සඳහාද අනෙක් රැස්වීම් දෙකක්ම **2021** වර්ෂය සඳහාද වේ. මෙම වසර සඳහා වන රැස්වීම්වලදී පලමුවන හා තුන්වන රැස්වීමේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාද රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයාද දෙවන රැස්වීමේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා Online හරහාද (Zoom) හරහාද සහභාගී වූහ.

විගණන කළමනාකරණකමිටු රැස්වීම	පළමුවන කාර්තුව - 2021	දෙවන කාර්තුව - 2021	තුන්වන කාර්තුව - 2021
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	10.02.2021	06.08.2021	22.12.2021
ප්‍රාදේශීය ලේකම් - කාර්යාලය කරච්චි	21.01.2021	29.04.2021	09.11.2021
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කන්ඩාවලෙ	02.02.2021	30.04.2021	17.11.2021
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පච්චිලෙප්පල්ලි	22.01.2021	22.04.2021	17.11.2021
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පූනකරි	02.02.2021	04.05.2021	23.11.2021

තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයාලවල අභ්‍යන්තර විගණක අංශ පිහිටුවා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීම අනුව විගණන කටයුතු සාර්ථකව සිදු කරමින් පවතියි.

අභ්‍යන්තර විගණන නිළධාරින් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපෘතීන් පරීක්ෂා කර එහි කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්තා දිසාපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විගණන කළමනාකරණ රැස්වීමේදී පහත කරුණු හා පද්ධතීන් ශක්තිමත් කිරීමටත් අනතුරු වළක්වා ගැනීමටත් සාකච්ඡා කරන ලදී.

- ❖ අභ්‍යන්තර පාලනය හා අවදානම
- ❖ අභ්‍යන්තර විගණනය නිරීක්ෂණය හා විධිමත් කිරීම
- ❖ කේෂ්ත්‍ර චාරිකා පිළිබඳ නිරීක්ෂණය
- ❖ ජාතික විගණන කාර්යාලයේ විමසුම් සමාලෝචනය කිරීම
- ❖ .ගතවූ කාලයේ රාජ්‍ය ගිණුම් කමිටුවේ රැස්වීම් වාර්තා පිළිබඳ මෙහෙයුම් ප්‍රගතිය

➢ **ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික්කය පුරා පැවැත්වූ ක්‍රියාකාරකම්**

මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ දිවයිනේ භූමි සම්පත විශිෂ්ට ලෙස පරිහරනය කිරීමට දිරිගැන්වීමයි. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නොයෙක් සේවාවන් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

අනු අංකය	වැඩ සටහන	ස්ථානය	මූල්‍ය ප්‍රතිපාදන	වියදම	ප්‍රතිශතය	ප්‍රතිලාභ ලබාගත් ඉලක්ක කණ්ඩායම
01.	පරිහරණය කළ හැකි නමුත් පරිහරණයට ගෙන නොමැති ඉඩම් හා අඩු පරිහරණ ඉඩම් හඳුනා ගැනීම	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	60000	60000	100%	
02.	පස හා ජලය සංරක්ෂණය මඟින් අඩු පරිහරණ කෘෂි ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	400000	399986	99.99%	හඳුනාගන්නා ලද ගෙවතු වගා ප්‍රතිලාභීන්
03.	හඳුනාගන්නා ලද ග්‍රාමීය ඉඩම් පරිහරණ ව්‍යාපෘතිවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම	පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	209000	208862	99.93%	හඳුනාගන්නා ලද ගෙවතු වගා ප්‍රතිලාභීන්
04.	දිස්ත්‍රික් කළාප ඇති කිරීමේ වැඩ සටහන	දිස්ත්‍රික් කාර්යාලය හා කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	50000	47614	95.22%	
05.	අනෙක් රජයේ කැලෑ ඉඩම් සළකුණු කිරීම	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	47000	47000	100%	
06.	තරුණ ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා රජයේ ඉඩම්වප ආයෝජන කිරීමේ අවස්ථාවන් ලබාදීමේ ව්‍යාපෘතිය	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	245900	231186	94%	ඉඩම් අයද සිටි අයවලුන් - තරුණ වයවසායකයින්

07.	රජය සතු ව්‍යාවසායන්ට අදාළ පරිහරණය කර නොමැති ඉඩම් හා දේපළ හඳුනා ගැනීම හා නිපුණතාවය තීරණය කිරීම.	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	10000	10000	100%	
08.	දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සමුළුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	13500	13400	99.25%	ඉඩම් අයද සිටි අයවලුන් (පොදු ජනතාවන්, දෙපාර්තමේන්තු
09.	ප්‍රාදේශීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සමුළුව	කරච්චි කණ්ඩාවලෙ පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	28000	27980	99.92%	ඉඩම් අයද සිටි අයවලුන් (පොදු ජනතාවන්, දෙපාර්තමේන්තු

➢ කර්මාන්ත දෙපාර්තමේන්තුව

* පේෂ කර්මාන්ත හා පුහුණුව
* .කොහු නිෂ්පාදනය හා පුහුණුව
* සාම්ප්‍රදායික කුඩා කර්මාන්ත පුහුණුව.
* අනෙක් සම්ප්‍රදායික නොවන කර්මාන්ත පුහුණු(Aari Embroidery work, Jewelry Making, කිරි ආශ්‍රිත නිෂ්පාදන)

2021 වර්ෂයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද තාක්ෂණික හුවමාරු පාඨමාලාවේ විස්තර පහත සඳහන් වේ.

අංකය	පුහුණු පාඨමාලාව	පුහුණුව පවත්වන ලද ග්‍රාම සේවා වසම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	කාලය	ප්‍රතිලාභී සංඛ්‍යාව
1	Aari Embroidery work	කනගපුරම්	කරච්චි	දින 05 ක්	15
2	Jewelry Making	කනගපුරම්	කරච්චි	දින 10 ක්	20
3	කිරි ආශ්‍රිත නිෂ්පාදන	මට්ටුවිල්නාඩු	පූනකරි	දින 10 ක්	20

කෙටි කාලීන පුහුණු පාඨමාලාව





මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යවසාය සේවා - 2021

අනු අංක	විස්තර	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය විස්තර	කාලය
1	ව්‍යවසායකයින් සඳහා උපකරණ ලබාදීම - පළාත් වෙන් කළ අරමුදල්	22	1036738	01.01.2021 – 31.12.2021
2	අපගේ අත්යන්ත්‍ර රෙදි විවීමේ ස්ථානයේ අත්යන්ත්‍ර රෙදි විවීමේ රැකියා ලබාදීම	2		01.01.2021 – 31.12.2021
3	අපගේ කොහු නිෂ්පාදන මධ්‍යස්ථානයේ රැකියා ලබාදීම	4		01.01.2021 – 31.12.2021
4	අළුත් අවුරුද්ද නිමිත්තෙන් ව්‍යවසායකයින්හට විශේෂ පොළක් සංවිධානය කිරීම. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක)	145	58250	08.04.2021 09.04.2021
5	පළාත් කර්මාන්ත ප්‍රදර්ශනය මඟින් දේශීය නිෂ්පාදකයින් දිරි ගැන්වීම)	30		23,24.10.2021

අළුත් අවුරුදු වෙළඳ පොළ - 2021







ව්‍යවසායකයින් සඳහා උපකරණ ලබාදීම - පළාත් වෙන් කළ අරමුදල්





රැකියා පුහුණු මධ්‍යස්ථාන හා වෙළඳ මධ්‍යස්ථාන

- අත්යන්ත්‍ර රෙදි විවීමේ මධ්‍යස්ථානය - දර්මපුරම් කන්ඩාවලෙ
- කොහු නිෂ්පාදන මධ්‍යස්ථානය - පුලෝප්පලෙ, පච්චිලෙප්පල්ලි
- ඇසුරුම් මධ්‍යස්ථාන - පල්ලික්කුඩා, පූනකරි
- දේශීයනිෂ්පාදනභාණ්ඩ අළෙවිහල - කිරුනගර්

➢ සංස්කෘතිකකටයුතුදෙපාර්තමේන්තුව

01. **සර්වාගමික ආගමික වතාවන්**

අළුත් අවුරුද්ද පිළිගැනීම නිමිත්තෙන් ආශීර්වාද පතා ප්‍රාර්ථනා හා ආගමික වතාවන් පහත ආගමික ස්ථානවල පවත්වනු ලැබුවේය. 100 දෙනෙක් පමණ සහභාගී වූහ.

- **නාගතම්බිරාන් දේවස්ථානය, පුලියම්පොක්කනෙ, කන්ඩාවලෙ** - 06.01.2021
- **ශාන්ත පේම්ස් දේවස්ථානය, කිලාලි, පච්චිලෙප්පල්ලි** - 07.01.2021
- **ලුම්බිනි විහාරය, ඒ පාරස කිලිනොච්චි** - 19.01.2021
- **මුගෙදීන් ජුම්මා පල්ලිය, නාච්චික්කුඩා, පූනකරි** - 19.01.2021





02. මහජනපුස්තකාලවලට පොත් ලබාදීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතරෙහි එක් පුස්තකාලයක් බැගින් තෝරා පුස්තකාල තුනකට පොත් පරිමාවක් බැගින් පරිත්‍යාග කරන ලදී. 20 දෙනෙක් පමණ සහභාගීවූහ.

- මහජන පුස්තකාලය ඉරණමාතා නගර් -26.10.2021
- මහජන පුස්තකාලය ස්කන්ධපුරම් -28.10.2021
- මහජන පුස්තකාලය මුහමාලෙ -02.11.2021





03. කලාකරුවන් සුවදම් වැඩ සටහන

කලා කේෂ්ත්‍රයට මහඟ සේවයක් ඉටු කළ කලාකරුවන්ගේ නිවෙස්වලට ගොස් ඔහුන්ගේ සුවදුක් විමසා ඔවුන්හට සහායක ද්‍රව්‍ය පිරිනමා ඔවුන් ගෞරවය කරනු ලැබුවෝය.

- පූනකරි – මුළංකාවිල්, කරියාලෙ නාගපඩුවාන් – 26. 10. 2021
- කරච්චි – අක්කරායන් - මනියංකුලම් – 28. 10. 2021
- පච්චිලෛප්පල්ලි – ඉත්තාවාල් , පුලෝප්පලෙ – 02. 11. 2021
- **කන්ඩාවලෙ - කුගෙමාවඩි - පරත්තන්** - 08.11.2021

➢ සංගණනහාසංඛ්‍යාලේඛණදෙපාර්තමේන්තුවේකටයුතු

ජනලේඛනහාසංඛ්‍යාලේඛනදෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලය වන අතර රජයට අවශ්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා මූලික වගකීම දරයි.

මෙම දිවයිනේ සමාජ ආර්ථික තත්ත්වය සම්බන්ධව සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, ලබාදීම යන එහි වගකීම්වලට අමතරවසංඛ්‍යා ලේඛණ සේවාවන් අවශ්‍ය වන සියළුම රජයේ නියෝජිත ආයතනයන්ට වෘත්තීය නිළධාරීන් පුහුණු කර සේවයේ යෙදවීමද මෙහි අරමුණ වේ. සංඛ්‍යානමය කරුණු සම්බන්ධයෙන් සහය අවශ්‍ය ආයතන වෙත එහි තාක්ෂණික අංශ හරහා සංඛ්‍යාන උපදේශන සේවා ද සපයයි.

දෙපාර්තමේන්තුවේ කටයුතු

- දුම්කොළ භාවිතය පිළිබඳ මිනුම්
- සාමාන්‍ය වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා වසරකට දෙවතාවක් පවත්වනු ලබන නියැදි මිනුම්
- කාර්මික වෙළඳ සේවා වාර්ෂිකව මැනීම
- වී සංඛ්‍යාලේඛන
- ගොඩ බිම් වගාව යළ හා මහ කන්න වී වගාව
- සිල්ලර මිල සහ නිෂ්පාදක මිල
- පශු වෛද්‍ය සංඛ්‍යා ලේඛන
- ඝාතකාගාර තුළ මරා දමන සතුන් ගණන
- ගොඩනැගිලි සංඛ්‍යා ලේඛන

කාර්යසාධන පියවර

2 වන පරිච්ඡේදය යටතේ ඇති සියලුම ව්‍යාපෘති 2021 වන විට අවසන් කර සාර්ථකව නිම කර ඇත.

වෙන් කරන ලද අරමුදල්	:	රු. 808655
වියදම් කළ අරමුදල්	:	රු. 623587
ඉතුරු අරමුදල	:	රු. 185067

➢ සැලසුම් අංශයේ කටයුතු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ විමධ්‍යගත අය වැය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ 2021 වර්ෂයේ රුපියල් මිලියන 15. 0365 **ක** ප්‍රතිපාදන නිදහස් කරන ලදී. මෙම සංවර්ධන වැඩ සටහන් කරච්චි, කන්ඩාවලෙ,පූනකරි හා පච්චිලෙප්පල්ලි ආදි ප්‍රාදේශීය කොට්ඨාශවල ක්‍රියාත්මක කරන ලදී.

වැඩ සටහන් ජල සැපයුම්, ග්‍රාමීයවිදුලි පහසුකම් ලබාදීම, මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම,අධ්‍යාපනය වැඩි දියුණු කිරීම, පොදු ක්‍රීඩාංගණ සංවර්ධනය, කුඩා වාරි මාර්ග, ලියා පදිංචි කරන ලද සමිතිවලට පහසුකම් සැලසීම, ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථානවලට පහසුකම් සැලසීම හා අනෙක් වැනි ක්ෂේත්‍ර යටතේ වැඩ සටහන්ක්‍රියාත්මක කරන ලදී.

ක්ෂේත්‍ර වශයෙන් ක්‍රියාත්මක කරන ලදප්‍රතිපාදන පිළිබඳ විස්තර

අනු අංකය	ක්ෂේත්‍ර	වැඩ සටහන් සංඛ්‍යාව	වෙන් කරන ලද සම්පූර්ණ මුදල රුපියල් මිලියන
1	ජල සැපයුම්	2	0.300
2	ග්‍රාමීයවිදුලි පහසුකම්	15	1.535
3	මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	1	0.120
4	අධ්‍යාපනය වැඩි දියුණු කිරීම	25	4.943
5	පොදු ක්‍රීඩාංගණ සංවර්ධනය	11	1.210
6	කුඩා වාරි මාර්ග	2	0.425
7	ලියා පදිංචි කරන ලද සමිතිවලට පහසුකම් සැලසීම	56	3.965
8	ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථානවලට පහසුකම් සැලසීම	17	2.3285
9	අනෙක්	1	0.210
	එකතුව	130	15.0365

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වශයෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	වැඩ සටහන් සංඛ්‍යාව	මුදල(රුපියල්)
1	**කරච්චි**	77	10.023
2	**කණ්ඩාවලෙ**	18	1.862
3	**පූනකරි**	23	2.273
4	**පච්චිලෙප්පල්ලි**	12	0.8785
	එකතුව	**130**	**10.0365**

සෞභාග්‍යා නිෂ්පාදන ග්‍රාම වැඩ සටහන

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයයටතේ රට ගොඩ නංවන " සෞභාග්‍ය දැක්ම" ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම සඳහා ගෘහ ආර්ථිකය හරහා නිෂ්පාදනය දිරි ගැන්වීම ග්‍රාමීය ජනතාවන්ගේ ආදායම ඉහළ නැංවීම හා ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබාදීම ආදිය අරමුණු කර ගනිමින් ආරම්භ කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ග්‍රාම වැඩ සටහනවනාහි කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරෙහි එක් ග්‍රාම සේවා නිළධාරි වසමක් බැගින් ග්‍රාම සේවා නිළධාරි වසම් 4 ක ආරම්භ කරන ලදී. නිෂ්පාදන ග්‍රාම සතරකට එක් නිෂ්පාදන ගම්මානයකට උපරිම මුදල් ප්‍රතිපාදනයක් වශයෙන් රුපියල් මිලියන 10 ක් බැගින් රුපියල් මිලියන 39.356 ක මුදලක් වෙන් කර වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද මෙම නිෂ්පාදන ගම්මානවල ජනතාවන්ගේ ජීවනෝපාය සංවර්ධනයට සෘජුවම දායකත්වය ලබා දෙන යටි තල පහසුකම් සංවර්ධනය කිරීමට ප්‍රාදේශීය ලේකම්

කොටියාශ සතරකට එක් ප්‍රාදේශීය ලේකම් කොටියාශයකට රුපියල් මිලියන 03 ක් බැගින් රුපියල් මිලියන 12 ක් වෙන් කර වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභීන් 680 දෙනෙකුට රුපියල් 2500 බැගින් රුපියල් 1700000 ක් නිෂ්පාදක තොරතුරු අඩංගු නාම පුවරු සවි කිරීම සඳහා මුදල් වෙන් කර වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් වෙන් කරන ලදමුදල් පිළිබඳ විස්තර





2021වන වර්ෂයේ ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධනරාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යෙන් සිදුකරන ලද විසිකිළි ඉදිකිරීමේ වැඩ සටහන

නිවාස යෝජනා

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධනරාජ්‍ය අමාත්‍යාංශය විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගැටුම් හේතුවෙන් පීඩාවට ලක් වූ උතුරු නැඟෙනහිර පළාතේ

අංක	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	නිවාස සංඛ්‍යාව	
		රුපියල් 600000.00	රුපියල් 1000000.00
1	කරච්චි	167	61
2	කන්ඩාවලෙ	80	21
3	පූනකරි	33	11
4	පච්චිලෙප්පල්ලි	50	37
එකතුව		330	130

ජනතාවන්හට සිමෙන්ති ගල්වලින් ඉදි කරන ලද ස්ථිර නිවාස යෝජනා ක්‍රමය යටතේ එක් අයෙකුට රුපියල් 600,000 ක් වටිනානිවෙස් 330 ක් හා එක් පුද්ගලයෙකුට රුපියල් 1000000 ක් වටිනා

නිවෙස් 130 ක්ද රුපියල් හා රුපියල් මිලියන 328 ක වියදමින් ඉදි කරන ලදී. පහත සඳහන් පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් වෙන් කරන ලදී.

“ගංගා සුරකිමු “ ජාතික වැඩ සටහන

අක්කරායන් ඔය හා අවට පරිසරය ආරක්ෂා කිරීමේ වැඩ සටහන

පාරිසරික අමාත්‍යාංශයේ රුපියල් මිලියන 4.1 මුදල් ප්‍රතිපාදන යටතේ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී. අවට පරිසරය හා ජීව විද්‍යාත්මක සම්පත් ආරක්ෂා කරමින් ජනතාවන්හට පිරිසිදු පානීය ජලය සැපයීම ප්‍රධාන අරමුණක් කර ගනිමින් මධ්‍යම පාරිසරික අධිකාරිය වනාහි අනෙක් සබැඳි ආයතන හා එක්ව මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ ආරම්භ කළේය. මෙම ව්‍යාපෘතිය යටතේ අක්කරායන් ගං පත්ලේ පහත සඳහන් වැඩ කොටස් නිම කර ඇත.

1. **පාංශු බාදනය වැළක්වීම හා ජලය රන තැන පල්වීම වැළක්වීම**
2. **අපද්‍රව්‍ය ඉවත් කිරීම**
3. **ගස් රෝපණය කිරීම**
4. **නීතිවිරෝධී වැලි කැනීම් වැළක්වීම**
5. **ඔයේ අවට පරිසරය අධ්‍යයනය කර ආරක්ෂා කිරීම**
6. **ගංඟා කළමනාකරණ ජල පෝෂක ස්ථාන විමර්ශනය කිරීම සහ කළමනාකරණය කිරීම**
7. **ජල ආදාන ව්‍යූහයන් ඉදි කිරීම**







➢ දිස්ත්‍රික්ක ආපදාකළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය

ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය වනාහි දිස්ත්‍රික්කයේ ආපදා අවදානම් කළමනාකරණ කටයුතුවල පහසුව තකා දිස්ත්‍රික් ලේකම් කර්යාලය සමඟ සම්බන්ධීකරණ කරමින් ක්‍රියාත්මක වෙමින් පවති. මෙහි ප්‍රධාන මෙහෙයුම් වශයෙන්

1. ආපදාවල අනාගත පීඩාවන්ආපදා අවම කිරීම සඳහා ප්‍රජාවන් හා පාර්ශවකරුවන් සූදානම් කර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය තත්වය යටතේ අවම කිරීම, වළක්වා ගැනීම හා පෙර සූදානම් ආදි ආපදා අවදානම අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට උපකාර කිරීම
2. දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනය තහවුරු කර ගැනීම සඳහාසංවර්ධන කේෂ්ත්‍රයේ ආපදා අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දිරි ගැන්වීම.
3. හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමට ක්ෂණික හා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලබන අතර දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිචාර දැක්වීම හා මුදා ගැනීමේ මෙහෙයුම් කඩිනම් කිරීමට අවශ්‍ය සියළු පාර්ශව සම්බන්ධීකරණ කිරීම ආදිය සිදුකරනු ලැබුවේ ය.

ආපදා කළමණාකරණ සම්බන්ධීකරණ ඒකකය 2021 වර්ෂයේදී ආපදා බලපෑම් අවම කිරීම සඳහා පහත පියවර ගෙන ඇත.

1. පුහුණු හා දැනුවත් කිරීමේ කටයුතු

වැඩ සටහන්	වැඩසටහන්සංඛ්‍යාව	වෙන් කිරීම්	වැය	ශේෂය
පුහුණු හා දැනුවත් කිරීමේ කටයුතු	11	150250	144555	5695



තාක්ෂණික නිළධාරීන් සඳහා ආපදා අවම කිරීමේ පුහුණුව



ධීවර ප්‍රජාව දැනුවත් කිරීම



ජාතික ආරක්ෂක දිනය 2021

2.සූදානම් සහ සැලසුම් කිරීමකටයුතු

වැඩ සටහන්	වැඩසටහන්සංඛ්‍යාව	වෙන් කිරීම්	වැය	ශේෂය
සූදානම් සහ සැලසුම් කිරීම කටයුතු	**15**	**195100**	**183940**	**11160**



දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මොසම් වැසි සාකච්ඡාව



සුනාමි පෙර සූදානම් සැලස්ම



ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම

3.ආපදා අවම කිරීමේ හා පර්යේෂණ හා සංවරනය

විස්තර	ප්‍රතිපාදන	වියදම්
කනගාම්බිගෙක්කුලම් වැවේ ජලපවහන ව්‍යූහයන් වැඩි දියුණු කිරීම	2000000	1997752



ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර



ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් තිබියදී



ව්‍යාපෘතිය අවසන් වූ පසු

4.ක්‍රියාකාරකම් හදිසි ප්‍රතිචාර

- කොවිඩ් 19 ප්‍රතිචාර ක්‍රියා
- ඊසානදිග මෝසම් ප්‍රතිචාර පියවර





➢ සමාජ සේවා දෙපාර්තමේන්තුව

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, බෝවන රෝග සහ කොවිඩ් රෝග පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය, වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලයේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. ආබාධිත පුද්ගලයන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමසඳහා රුපියල් 5000ක දීමනාවක් ලබා දෙනවා

අනුඅංකය	ප්‍රාදේශීයලේකම්කොට්ඨාශය	දීමනාව ලබා ගන්නා ප්‍රතිලාභීන්	පොරොත්තු ලේඛණයේ සිටින අයවලුන්
01	කරච්චි	545	922
02	කන්ඩාවලෙ	299	326
03	පූනකරි	304	301
04	පච්චිලෙප්පල්ලි	135	195
	එකතුව	**1283**	**1744**

අනුඅංකය	ප්‍රාදේශීයලේකම්කොට්ඨාශය	දීමනාව ලබා ගන්නා ප්‍රතිලාභීන්	රුපියල් 2000දීමනාව ලබා ගැනීමට සුදුසු ප්‍රතිලාභීන්
01	කරච්චි	2104	800
02	කන්ඩාවලෙ	728	330
03	පූනකරි	612	206
04	පච්චිලෙප්පල්ලි	378	170
	එකතුව	**3822**	**1506**

3. වකුගඩු රෝගීන්ට රුපියල් 5000ක දීමනාවක් දෙනු ලැබේ.

අනුඅංකය	ප්‍රාදේශීයලේකම්කොට්ඨාශය	දීමනාව ලබා ගන්නා ප්‍රතිලාභීන්	රුපියල් 5000දීමනාව ලබා ගැනීමට සුදුසු ප්‍රතිලාභීන්
01	කරච්චි	187	70
02	කන්ඩාවලෙ	56	8
03	පූනකරි	37	05
04	පච්චිලෙප්පල්ලි	12	13
	එකතුව	**292**	**96**

4.දිස්ත්‍රික්කය සඳහා වන ප්‍රතිපාදන

අනුඅංකය	විස්තර	ප්‍රතිපාදන (රු)	වියදම (රු.)
01	වැඩිහිටි දීමනාව) අවුරුදු70 ටවඩාවැඩිඅයවලුන්(	91730000	90080700
02	ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන දීමනාව)අවුරුදු100ටවඩාවැඩිඅයවලුන්(		120000
03	ආබාධිතවූවන්සඳහාවනදිමනාව	84030000	83965000
04	වකුගඩු රෝගීන් සඳහා වන දීමනාව	17760000	17760000
05	**CBR** වෙන් කිරීම	45000	44675

5. **විකල්ප සවිබල ඇති පුද්ගලයින් ප්‍රවර්ධනය කිරීම සඳහා ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලද වැඩසටහන්.**

අංකය	දෙපාර්තමේන්තුව	වැඩ සටහන	ලැබුණු ප්‍රතිලාභ (රු)
01	ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය	රැකියාවේ නියුතු ආබාධ සහිත පුද්ගලයින් සඳහා දිරි දීමනා	2283000
02	තනිමාපියගෘහමූලිකපවුල්වලට අධ්‍යාපනික ආධාර		400000

6. **වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්**

අංකය	දෙපාර්තමේන්තුව	වැඩ සටහන	ලැබුණු ප්‍රතිලාභ (රු)
01	වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලය	වැඩිහිටි ස්වයං රැකියාව	100000
		ආරෝග්‍යා	75000
		අවම ආධාර	300000
		වැඩිහිටි සංගම් ශක්තිමත් කිරීම	200000

7. **ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා 2019 වසරේ රුපියල් මිලියන 80 ක මුදලක් වෙන් කර ඇති අතර මේ වන විට රුපියල් මිලියන 45**

➢ මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු

කිළිනොච්චි මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ශාඛාව විසින් පොදු ජනතාවට අවශ්‍ය රියදුරු බලපත්‍ර ලබා දීම , ඔවුන්ගේ වාහන අංක තහඩු ලබා දීම ඔවුන්ගේ වාහන අවශ්‍ය පරිදි පරීක්ෂා කර පරීක්ෂණ සහතික ලබාදීම ආදී සේවාවන් ඉටු කරයි. මෙලෙස පසුගිය 2021 වර්ෂයේ පොදු ජනතාව වෙනුවෙන් ලබා දෙන ලද සේවාවන් මෙසේය.

1. අයදුම්පත් 3370 ක්ද, මීට පෙර රියදුරු බලපත්‍ර ලබා ගත් අයගේ සැහැල්ලු වාහන දිගුව සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් 380 ක්ද , බරවාහන දිගුව සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් 438 ක්ද , රියදුරු බලපත්‍ර අළුත් කිරීම සඳහා අයදුම් පත් 2169 ක් වශයෙන් සම්පූර්ණ රියදුරු අයදුම්පත් 6357 ක් ලබා ගන්නා ලදී.

2. මෙලෙස ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් 3370 දෙනෙකුටද , බර වාහන දිගුවට අයදුම්කළ 438 දෙනෙකුටද , නැවත පරීක්ෂණය අයදුම් කළ 1639 දෙනෙකුටද ලිඛිත පරීක්ෂණ පවත්වන ලදී. ඔවුන් අතරෙන් සමත් වූ 3193දෙනෙකුට පුහුණු බලපත්‍ර ලබා දෙන ලදී.

3.ලිඛිත පරීක්ෂණයෙන් සමත්වූ පුහුණු බලපත්‍රලාභීන් 3193 දෙනෙකුට හා සැහැල්ලු වාහන දිගුව සඳහා අයදුම්කළ 380 දෙනෙකු සමග සම්පූර්ණයෙන් **3673** දෙනෙකුට ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා **තාවකාලික** රියදුරු බලපත්‍ර ලබා දෙන ලදී.

4.එමෙන්ම ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත් වාහන 282 ක අංක තහඩු හිමිකරුවන්ට බෙදා දී ඇත

5. වාහනවල බඳ වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කළ 25 දෙනෙකුගේ වාහන පරීක්ෂා කර වාහන බර සහතික නිකුත් කර ඇත. එමෙන්ම විවිධ අවශ්‍යතා සඳහා වාහන පරීක්ෂා කර පරීක්ෂණ වාර්තා 222ක් නිකුත් කර තිබෙනවා.

6. ප්‍රධාන කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද IVR පද්ධතිය සමඟින් ප්‍රතිලාභීන්ට දිගු කාලයක් බලා සිටීමකින් තොරව විශාල සේවා ප්‍රමාණයක් ලබාදේ.

මෙම කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ඉහත සේවාවන් හරහා රුපියල් 17192155ක සේවා ගාස්තුවක් ලැබී ඇත.

➢ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කටයුතු

ලේඛණ ලියාපදිංචි කිරීම

I.	ලියාපදිංචි කරන ලද ඔප්පු	105
	a. කඩිනම් සේවය	
	b. සාමාන්‍ය සේවය	
II.	ලියාපදිංචි කරන ලද රජයේ දීමනා පත්‍ර	1400
III.	ලබා ගත් අනු පිටපත්	1004
IV.	ලබා දෙන ලද ඔප්පු පිටපත්	
	a. කඩිනම් සේවය	116
	b. සාමාන්‍ය සේවය	140
V.	ලබා දෙන ලද සාරාංශ පිටපත්	
	a.කඩිනම් සේවය	1333

b. සාමාන්‍ය සේවය 784

VI. ලබා දෙන ලද අනුමාන මයස සහතිකය
VII. ලබා ගත් සොයා බැලීමේ අයැදුම් පත් 05
VIII. *අනුමන* කල් ගතවූ උප්පැන්න
IX. පරිවර්තන අයැදුම් පත් සංඛ්‍යාව-
X. ලබා ගත් උප්පැන්න, මරණ, විවාහ අයැදුම් පත් 2527

ගාස්තු (ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය)

I. ඔප්පුලියාපදිංචිකිරීම
a. කඩිනම් සේවය 97900
b. සාමාන්‍ය සේවය 97900
219840

II. ඔප්පු පිටපත් , සාරාංශ පිටපත්
a. කඩිනම් සේවය 382600
b. සාමාන්‍ය සේවය 163820
III. සෙවීම් 2800
IV. මුද්දර අගය පිටපත් කිරීමට අලවා ඇත 26832663
V. පරිවර්තන ගාස්තු -
VI. ලබා ගත් උප්පැන්න, මරණ, විවාහ අයැදුම් පත් 420060

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු විස්තර

I. ලබා ගත් උප්පැන්න, මරණ, විවාහ අයැදුම් පත් 28583
II. ලබා දෙන ලද පිටපත් 42377
ලියා පදිංචි කරන ලද
උප්පැන්න 2909
මරණ 647
විවාහ 1017
III. අනුමත සංශෝධන් (27,27(a),52(1)) 2897
IV. *අනුමන* කල් ගතවූ උප්පැන්න (24) 661
V. *අනුමන* කල් ගතවූ මරණ(36) 21

ගාස්තු විස්තර(ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

I. **(කරච්චි, කන්ඩාවලෙ, පච්චිලෙපල්ලි, පූනකරි)**
ලබා ගත් උප්පැන්න, මරණ, විවාහ අයැදුම් පත්
අයැදුම් පත් සඳහා වන ගාස්තුA+B 4817060
II. ලබා ගත් කල් ගතවූ උප්පැන්න, මරණ, සංශෝධන පිළිබඳ ගාස්තු 52300
III. විවාහ ලියාපදිංචි ගාස්තු 26240

➢ ක්‍රීඩා අංශය

2021 වර්ෂයේ ප්‍රාදේශීය මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වන ලද ක්‍රීඩා උත්සවවල ඉලක්ක මෙසේ

ක්‍රීඩා ප්‍රභේදය	සහභාගි වන ක්‍රීඩකයන්	
	පිරිමි	කාන්තා
ක්‍රිකට්	1st	2nd
එල්ලේ	3rd	2nd
කවඩි	2nd	2nd
වෙරළ කවඩි	3rd	1st
බීච් නෙට්බෝල්	3rd	2nd
දැල් පන්දු	3rd	2nd
කරාටේ	3rd	2nd
ජූඩෝ	2nd	2nd
Taek wondo	2nd	2nd
T.T		2nd

➢ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු

කිළිනොච්චි දිස්ත්‍රික්කයේසමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුල්‍ය ප්‍රතිපාදන යටතේ 2021 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතර සඳහා සුබසාධන දීමනාව ලබා දුන්නේ මෙසේය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සුබසාධන දීමනාව ලබා ගන්නා සමෘද්ධී පවුල්	ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාවමූලික වශයෙන් සුබසාධන දීමනාව රු			
		මුද්දර රු.420/=	මුද්දර රු.. 1500/=	මුද්දර රු.2500/=	මුද්දර රු.3500/=
කරච්චි	3830	0	1227	648	1955
	3262	0	1093	594	1575
	5590	0	1737	1019	2834
කන්ඩාවලෙ	5073	0	1695	963	2415
පූනකරි	1588	0	484	291	813
	2323	0	719	347	1257
පච්චිලෙප්පල්ලි	2085	22	654	392	1017
එකතුව	**23751**	**22**	**7609**	**4254**	**11866**

1. සමෘද්ධි සමාජ ආරක්ෂණ දීමනා (උපත, මරණ, රෝහල් දීමනාව, සිප්දොර ශිෂ්‍යත්වය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතර සඳහා ප්‍රතිලාභීන් 19314ක් සඳහා රුපියල් මිලියන 6.6ක් ලබා දෙන ලදී.

2. සමෘද්ධි විශේෂ ජීවනෝපාය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 77 දෙනෙකු සඳහා රුපියල් මිලියන *3.8*ක් වටිනා ජීවනෝපාය ආධාර ලබා දෙන ලදී.

3. සමෘද්ධි සවි බල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 1438 දෙනෙකු සඳහා රුපියල් මිලියන 71.9 ක් වටිනා ජීවනෝපාය ආධාර ලබා දෙන ලදී.

4. කන්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් තට්ටුවන් කොට්ටි ග්‍රාම සේවක වසමේ සමෘද්ධි සෞඛ්‍ය ආපන ශාලාව රුපියල් මිලියන *3* ක වියදමින් පිහිටුවා ඇත.

5. සමෘද්ධි ගෙවතු වගා සංවර්ධන වැඩසටහන යටතේ පළතුරු පැළ 39478ක්, බීජ ධාන්‍ය පැකට් 10195ක් සහ කුකුල් පැටවුන් 2850ක් ලබා දෙන ලදී.

6. සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන යටතේ රුපියල් මිලියන 4ක වියදමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක නිවාස 20ක් ඉදිකර ඇත.

7. සමෘද්ධි සෞභාග්‍යා නිවාස වැඩසටහන යටතේ රුපියල් මිලියන 2.4ක වියදමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක නිවාස 4ක් ඉදිකර ඇත.

8. සමෘද්ධි ප්‍රජා සංවර්ධන අරමුදලින් රුපියල් මිලියන 0.39***ක*** වියදමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක වැසිකිළි 15ක් ලබා දෙන ලදී.

9. දිරියපියස සහන යෝජනා ක්‍රමය යටතේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට රුපියල් මිලියන *0.4*ක් වටිනා නිවාස 02ක් ලබා දෙන ලදී.

10. ***සමෘද්ධිනිවාසලොතරයිඅරමුදලයටතේප්‍රාදේශීයලේකම්කාර්යාල***04***කටසමෘද්ධිප්‍රතිලාභීන්සඳහාරුපිය ල්මිලියන***9. 6***ක්ලබාදෙනලදී***

➢ විදේශරැකියාඅමාත්‍යාංශය

විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ 2021 වර්ෂයේදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- රැකියාවෙන් ඉවත්වීම හෝ Covid-19 ආසාදනය හේතුවෙන් නැවත මෙරටට පැමිණි අය සඳහා පුනරුත්ථාපන වැඩසටහන

  වැඩසටහන් ගණන - 04

- මිනිස් ජාවාරම හෝ මිනිස් ජාවාරම සහ ආරක්ෂිත සංක්‍රමණය පිළිබඳ වැඩසටහන
  වැඩසටහන් ගණන - 06

- පුහුණු ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ වැඩසටහන
  වැඩසටහන් ගණන - 08

➢ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර:
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පච්චිලෙපල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති මුහමාලේ ආරෝක්කියා මාතා දේවස්ථානයේ දොර ජනෙල් සවිකිරීම සඳහා රුපියල් 500000 ක් වෙන් කර ඇති අතර එහි කටයුතු අවසන් කර ඇත.

➢ දිස්ත්‍රික් විදාතා මධ්‍යස්ථානය

වේවැල්, පිත්තල, මැටි භාණ්ඩ, දැව සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හරහාක්‍රියාත්මක කරන ලද ජාතික වැඩසටහන
ව්‍යාපෘතියේ නම: ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් සඳහා ව්‍යවසායකයෙකු සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන දිස්ත්‍රික් විදාතා මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක් හරහා තෝරාගත් ප්‍රතිලාභීන්ට ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සහ යන්ත්‍රෝපකරණ එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිල දී ගෙන ලබා දෙන ලදී. මිලියන 4.1ක මූල්‍ය ප්‍රතිපාදන.

2.1විශේෂ ජයග්‍රහණ හා අභියෝග

උතුරු පළාතේ මධ්‍යම ප්‍රදේශයේ වන හා වනය ආශ්‍රිත ප්‍රදේශ, කුඹුරු හා කුඹුරු ආශ්‍රිත ප්‍රදේශ, මුහුදු හා මුහුදු ආශ්‍රිත ප්‍රදේශ හා වැලි හා වැලි ආශ්‍රිත ප්‍රදේශ ආදී සතර ගුණැති භූමිය සතු කර ගෙනඋතුර යාපනය දිස්ත්‍රික්කය සීමාව ලෙසද නැඟෙනහිර හා දකුණු දිසාව මුලතිව් දිස්ත්‍රික්කය සීමාව ලෙසද බස්නාහිර දිසාව හා දකුණු දිසාව මන්නාරම් දිස්ත්‍රික්කයද මායිම් වශයෙන් ද පිහිටා ඇත. එමෙන්ම එය පුරාණ ඉතිහාස කතා පවසන සුවිශේෂී දිස්ත්‍රික්කයකි

වර්ග කිලෝමීටර 1279 වපරිසයෙන් යුතු ස්වභාවික සම්පත්වලින් හෙබි කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කරච්චි, කන්ඩාවලෙයි, පූනකරි, පච්චිලෙප්පල්ලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරද ජනතාවන්ගේ ස්වෛරිභාවය සුරැකෙන අයුරෙන් හා රජයේ ප්‍රතිපත්තීන් හා සැළසුම්වලට අනුව නවීන තාක්ෂණ ක්‍රමවේදයන් හසුරවීම මඟින් ජනතාවට විශිෂ්ඨ සේවාවක් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු වැඩි කොටසක් විද්‍යුත්කරණය කර ඒ හරහා උපරිම ඵළදාවක් ලබා ගැනීම සඳහා e-letter Management System, e-staff Management System, e-stock Management System, e-rating System, e-voucher management System ආදිය උපයෝගි කර ගැනීම අපගේ විශිෂ්ඨ කාර්ය සාධනයන්හි වැදගත් එකක්වේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු ඒකක මඟින් පරිපාලන මුදල් භාෂාව තොරතුරු සන්නිවේදනය ආදි නොයෙක් පුහුණු වැඩ මුළු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණෙන් සැළසුම් කර පවත්වා ගෙන යනු ලැබුවේය.

අපගේ දිස්ත්‍රික්කයේ රැකියා විරහිත ගම්බද තරුණියන් දිරිමත් කිරීමේ කටයුතුවල ඇඳුම් නිර්මාණය, අත්කම්, ගෘහ ආර්ථිකය හා සෞන්දර්යය වැනි ස්වයං රැකියා පුහුණුව ලබාදී පූර්ණ ජයග්‍රහණයක් ලබා ගත්තෙමු. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මාර්ග ප්‍රතිසංස්කරණය, කුඩා පාලම් ඉදිකිරීම, ජල සම්පාදනය, සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම, පාසැල්වල යටිතල පහසුකම් සැලසීම, ජීවනෝපාය සඳහා යටිතල පහසුකම් සැලසීම, ළමා උයන් ඉදි කිරීම, පාසැල්වල සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම, ක්‍රීඩා සංවර්ධනය, විදුලි පහසුකම් සැපයීම, ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය හා වෙනත් යටිතල පහසුකම් සලසා දෙන ලද අතර යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාවන් ගේ ජීවනෝපාය ඉහළ නැංවීම උදෙසා ජීවනෝපාය ආධාර ලබා දෙනු ලැබුවේය.

තවද අපගේ දිස්ත්‍රික්කයේ ජනතාවන්හට සිමෙන්ති යොදා ස්ථිර නිවෙස් 460 ක් ඉදි කරන ලදී. ලොව විශාලතම වසංගත කොරෝනා වෛරසයේ බලපෑමෙන්ජනතාවන් ආරක්ෂා කර ගැනීමට හොඳම ආකාරයෙන් කටයුතු කර ඇති අතර මෙම වසංගතයෙන් තමන්ව ආරක්ෂා කර ගැනීමට සංසරණ සීමා පැනවූ කාලයන්හි අපගේ ජනතාවන් ගෙවතු වගා හා ස්වයං රැකියාවල නිරතවී තම ජීවනෝපාය රඳවා

තබා ගැනීමත් විශේෂයෙන් සඳහන් කළ යුතු එකක්වේ. තවද දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය විසින් කොවිඩ් 19 ප්‍රතිචාර කටයුතු වඩා හොඳින් සිදු කර ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

තවද අපගේ දිස්ත්‍රික්කයේ පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමට නීති විරෝධී වැලි කැනීම් හා කැලෑ එළි කිරීම් සිදු නොවන අයුරෙන් ආරක්ෂිත පාර්ශවයන් හා පොලීසියේ සහය ලබා ගෙන නිසි පියවර විශිෂ්ඨ ලෙස ත

කිලිනොච්චි දිස්ත්‍රික් ජනතාවන්ගේ ජීවනෝපාය හා සංවර්ධන කටයුතු ආදිය ප්‍රමිතියෙන් යුතුව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කරනු ලබන අතර අපගේ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනය ලභා කර ගැනීම අපගේ අරමුණවේ.

රූ. කේතීස්වරන්,

දිසාපති / දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කායර්ාලය,

කිලිනොච්චි.

ආර්.කේදිස්වරන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
කිලිනොච්චි දිස්ත්‍රික්කය

03. දෙසැම්බර් 31 වන දිනෙන් වසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්සීඒ-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහ	තත්‍ය 2021 රු.	නැවත ගලපන 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්සීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,491,480,000	1,798,558,139	එස්සීඒ-3
-	තෑන්පතු		114,358,593	190,692,075	එස්සීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		16,560,762	12,486,580	එස්සීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	374,172	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,622,399,355**	**2,002,110,966**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,622,399,355**	**2,002,110,966**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		48,000,000	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,574,399,355**	**2,002,110,966**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
210,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රති	5	208,933,039	200,583,399	
62,575,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	52,643,799	51,059,186	එස්සීඒ-2(ii)
62,855,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	61,620,648	359,322	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
335,930,000	**මුළු පුනරාවර්තන වියදම් (ඒ)**		**323,197,486**	**252,001,907**	
	මූලධන වියදම්				
11,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	9,152,013	4,614,685	
18,200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	17,466,739	43,746,213	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්සීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,700,000	හැකියා වර්ධනය	14	1,425,884	460,699	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
31,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**28,044,636**	**48,821,597**	
	තෑන්පතු ගෙවීම්		130,949,410	210,991,480	එස්සීඒ-4
17,000,000	අත්තිකාරම් ගෙවීම්		19,784,690	10,576,075	එස්සීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
17,000,000	**ප්‍රධාන ලෙජර් වියදම් (උ)**		**150,734,101**	**221,567,555**	
384,430,000	**මුළු වියදම් එ = (ඒ+උ+උ)**		- 501,976,223	- 522,391,059	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		1,072,423,133	1,479,719,907	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		1,072,423,133	1,479,719,907	එස්සීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එස්සීඒ-3

1

K.S.Kajenthiran
Chief Accountant
For District Secretary,

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒඑසිඒ-6	1,333,022,830	1,307,365,591
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසිඒ-5/5(ඒ)	41,358,614	38,134,686
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසිඒ-3	-	-
මුළු වත්කම්		**1,374,381,444**	**1,345,500,277**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		10,330,404	(9,484,342)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,333,022,830	1,307,365,591
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒඑසිඒ-4	31,028,210	47,619,027
අග්‍රිම ශේෂය	ඒඑසිඒ-3	-	-
මුළු වගකීම්		**1,374,381,444**	**1,345,500,277**

පිටු අංක **07** සිට **79** දක්වා ඒඑසිඒ 1 සිට ඒඑසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක **80** සිට **88** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධි
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 13.02.2022	දිනය : 13/02/2022	දිනය : 15/02/2022
එන්.එච්.එම්. චිත්‍රානන්ද ලේකම් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	ආර්.කේදිස්වරන් දිසාපති / දිස්ත්‍රික් ලේකම් කිලිනොච්චි දිස්ත්‍රික්කය	K.S.Kajenthiran Chief Accountant For District Secretary, District Secretariat, Kilinochchi.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	75,530,563	109,843,463
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,491,480,000	1,798,558,139
අත්තිකාරම් අයකර ගැනීම්	21,292,746	12,761,444
තැන්පතු ලැබීම්	114,358,593	190,692,075
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,702,661,902**	**2,111,855,121**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	261,517,018	251,276,816
සහනාධාර සහ මාරුකිරීම්	61,620,648	359,322
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	1,140,398,767	1,586,954,838
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	48,000,000	-
අත්තිකාරම් ගෙවීම්	32,131,423	13,825,241
තැන්පතු ගෙවීම්	130,949,410	210,991,480
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (අ1)	**1,674,617,267**	**2,063,407,697**
(අ2)	**28,044,636**	**48,447,424**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
ගැනීම්	28,044,636	48,821,597
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**28,044,636**	**48,821,597**
(ඉ)	**(28,044,636)**	**(48,821,597)**
ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**(374,172)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ1)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ1)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	(374,172)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	374,172
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

K.S.Kajenthiran
Chief Accountant
For District Secretary,

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒ/ඕසී/ල් - 1

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

දිමේ නිලධාර :කිලිනොච්චි — වියදම් ශීර්ෂ අංකය :268 — රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තු (1)		ආදායම් රැස්කිරීම් (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
		මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ ඇමතිතුමා (ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානීගේ) නිසියි රැස්කිරීම්	වෙනත් ආකාරයකින් දෙපාර්තමේන්තු මේන්තු නිසියි රැස්කිරීම් (SA-21)	එකතුව	ශීර්ෂ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදී නිවැරදි කිරීම්	එකතුව	ශුද්ධ ආදායම
		1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
සටහන - 1	**ආදායම් බද්දෙ**										
1004.01.01	ආදායම් බද්දෙ										
1004.01.02	ලාභාංශ බද්දෙ										
1004.01.03	ප්‍රේෂණ බද්දෙ										
1004.01.00	**මුළු සාමූහික බද්දෙ**										
1004.02.01	**දේපල වට ගෙවීම් බද්දෙ**					නිල්					
1004.02.99	**අනෙකුත්**										
1004.03.00	**රදවා ගැනීමේ බදු**										
